---

## මන්මුනෙයි - බටහිර ප්‍රාදේශිය සභාව

## මඩකලපුව දිස්ත්‍රික්කය

### 1 . මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 08 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 27 දින ඉදිරිපත් කරන ලදී . සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 11 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

### 1.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව, මන්මුනෙයි- බටහිර ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපැම හැර 2012 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි - බටහිර ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 ( 2 ) වගන්තිය ප්‍රකාරව විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනයන් හි ප්‍රතිපාදන සලසා නොතිබුණි .

---

(ආ) මූල්‍ය ප්‍රකාශනයන්හි ස්ථාවර වත්කම් වෙනුවෙන් ප්‍රතිසම්පාදන සංචිතය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු භාණ්ඩ වල වටිනාකම මූල්‍ය පකාශනයන් හි ඇතුලත් කර නොතිබුණි.

(ඈ) නැතිවූ වත්කම් වල වටිනාකම වූ රු.183,122 ස්ථාවර වත්කම් ගිණුමෙන් ඉවත් කර නොතිබුණු අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි වත්කම් ලෙස දක්වා තිබුණි.

2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

---

2 .1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.4,468,002 ක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,928,699 ක් විය .

2.2 ආදායම් පරිපාලනය

---

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

---

සභාපතිවරයා විසන් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හඟ ආදායම |
|---|---|---|---|
| | රු " 000 | රු " 000 | රු " 000 |
| (i) වරිපනම් සහ බදු | - | - | - |
| (ii) කල්බදු කුලී | 1,891 | 890 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 335 | 407 | - |
| (iv) වෙනත් ආදායම් | 2,162 | 2,023 | 03 |

2.3 නිශ්ක්‍රිය සහ ඌන උපයෝජිත භෞතික සම්පත්

වටිනාකම රු.960,000 ක් වූ ඉඩම් සහ ගොඩනැගිලි 2007 ජනවාරි 01 දින සිට අපේක්ෂිත කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි .

2.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

කොන්ත්‍රාත්කරුවෙකුට කුලියට දෙන ලද සාප්පුවක විදුලි ගාස්තු වශයෙන් සභාව රු.18,228 ක මුදලක් ගෙවා තිබුණු නමුත් කොන්ත්‍රාත්කරුගෙන් හිඟ මුදල් අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

3 . පද්ධති හා පාලන .

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමණාකරණය
(ඈ) අයවැය පාලනය